www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආන්ඩුව ආරක්ෂක කාර්ය මන්ඩල ප්‍රධානියාට පුලුල් බලතල පවරයි

## Sri Lankan government hands greater powers to Chief of Defence Staff

**සරත් කුමාර විසිනි**

**2009 ජූනි 17**

අගමැති රත්නසිරි වික්‍රමනායක ජූනි 9 දින, සැලකිය යුතු බලතල සහිත ආරක්ෂක කාර්ය මන්ඩල ප්‍රධානියෙකුගේ (සීඩීඑස්) නව තනතුරක් ස්ථාපනය කරන පනතක් පාර්ලිමේන්තුවේ සභාගත කලේය. එල්ටීටීඊ පරදවා ලත් ජයග්‍රහනය ප්‍රකාශයට පත්කර යන්තම් සති තුනක් ඉක්ම යාමටත් පෙර ගනු ලබන මෙම පියවර මඟින් මිලිටරියේ භූමිකාව තවදුරටත් ශක්තිමත් කරමින්, දැන් ජනාධිපති මහින්ද රාජපක්ෂ වටකර සිටින දේශපාලන-මිලිටරි කල්ලියේ තත්වය තහවුරු කරනු ඇත.

පනත, හුදෙක් පාලක සන්ධානයේ පමනක් නොව, විපක්ෂයේ ප්‍රධාන පක්ෂ වන එක්සත් ජාතික පක්ෂයේ හා ජනතා විමුක්ති පෙරමුනේද අනුමැතියෙන් සම්මත වීම නිසැකය. යුද්ධයට සහයෝගය දුන් එම පක්ෂ දෙකම අවසන් වශයෙන් එල්ටීටීඊ පරාජයට පත්වීමෙන් හා ලක්ෂ තුනක් පමන දෙමල වැසියන් කඳවුරු තුල කොටු කිරීමෙන් අනතුරුව, මිලිටරිය උත්කර්ෂයට නැංවීමෙහිලා ආන්ඩුව සමඟ එක් වූහ.

පවත්නා සීඩීඑස් තානාන්තරය නිර්මානය කරන ලද්දේ හදිසි නීති රෙගුලාසි යටතේ 1999 ජූනි මාසයේ ය. එයට හිමිව ඇත්තේ ජනාධිපති හා ජාතික ආරක්ෂක මන්ඩලය (ජාආම) විසින් නිකුත් කරන නියෝග ක්‍රියාත්මක කිරීම හා ආරක්ෂක හමුදාවන්ගේ සූදානම පිලිබඳව ජාආම ට උපදෙස් දීමයි. ඒ යටතේ පාබල, නාවික හා ගුවන් යන ත්‍රිවිධ හමුදාවන්ගේ ප්‍රධානීන්ට සිය සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ස්වාධීනත්වයක් තිබුනි.

ඊට පටහැනි ලෙස නව සීඩීඑස්, ඒකාබද්ධ මෙහෙයුම් මධ්‍යස්ථානයට අනදෙන අතර, ආරක්ෂක අංශ තුනේ ප්‍රධානීන් මත වඩාත් දැඩි පාලනයක් ගෙනයනු ඇත. ආරක්ෂක හමුදාවන්ගේ ආඥාපති ලෙස කටයුතු කරන ජනාධිපති, සේවයේ නියුතු පාබල, නාවික හා ගුවන් හමුදාපති වරුන් අතරින් අයෙක් සීඩීඑස් ලෙස පත්කරනු ඇත. සීඩීඑස්, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ, වර්තමානයේ නම් ජනාධිපතිගේ සොයුරු ගෝඨාභයගේ, '' මගපෙන්වීම, නිරීක්ෂනය හා පාලනය යටතේ ක්‍රියාකරනු ඇත.''

පනත අනුව ''සන්නද්ධ හමුදාවන්ට මූලෝපායික මඟ පෙන්වීම, සන්නද්ධ හමුදාවන්හි ඒකාබද්ධ සේවා නියුක්තිය සඳහා පිලිවෙත් වර්ධනය කිරීම, මූලෝපායික සැලසුම් සූදානම් කිරීමට පහසුකම් සැලසීම'' සීඩීඑස්ගේ කටයුතුවලට ඇතුලත් ය. එමෙන්ම ඔහු, ''බුද්ධි අංශ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ කටයුතු සම්බන්ධීකරනයේ'' ද නිරතවනු ඇත. එසේම ක්‍රියාන්විත හා අවිනිශ්චිත තත්වයන් පිලිබඳ සැලසුම් සැකසීම ද හමුදාවලට බඳවාගැනීම් හා මිලට ගැනීමේ ටෙන්ඩර් පරිපාටිය පිලිබඳ උපදෙස් දීම ද ඔහුගේ රාජකාරියට ඇතුලත් ය.

ත්‍රිවිධ හමුදා ප්‍රධානින්ගෙන් සැදුම්ලත් ආරක්ෂක කාර්ය මන්ඩල කමිටුවේ සභාපතිත්වය දරන සීඩීඑස්, සන්නද්ධ හමුදා හා ආරක්ෂක අමාත්‍යාංශය අතර සම්බන්ධතා හසුරුවනු ඇත. ඔහුගේ නිල කාලය දෙවසරක් වන අතර, ජනාධිපතිට ඔහුගේ නිල කාලය තවත් දෙවසරකින් දීර්ග කල හැකි ය. ''හදිසි අවස්ථා තත්වයක් තුල'' ඔහුගේ නිල කාලය ඕනෑම වාර ගනනකින් දික් කල හැකිය.

වර්තමානයේ සීඩීඑස් ලෙස කටයුතු කරන්නේ ගුවන් හමුදා ප්‍රධානී ඩොනල්ඩ් පෙරේරා වන නමුත්, කොලඹ මාධ්‍ය සමපේක්ෂනය කරනුයේ හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා පාර්ලිමේන්තුව මඟින් පනත සම්මත කල පසුව එම තනතුරට පත්වනු ඇති බවට ය. යුද්ධය පිලිබඳ විවේචනය කරන අයට තර්ජනය කරමින් නිරතුරුව ප්‍රකාශන නිකුත්කර ඇති ඔහු, විශේෂයෙන්ම යුද්ධය පැවති පසුගිය තෙවසරක කාලය තුල වඩාත්ම බලගතු හා නිර්ධය ජෙනරාල්වරයා ලෙස ඉස්මතුවී තිබේ.

පසුගිය දෙසැම්බරයේ, ''ලෙෆ්ටිනන්ට් ජෙනරාල් සරත් ෆොන්සේකා-මේ මොහොතේ මිනිසා'' යන හිසෙන් යුතුව, ෆොන්සේකා සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක්, ආන්ඩුවේ නිල ප්‍රවෘති වෙබ් අඩවියේ

පලකල අතර, එහිදී ඔහු මිලිටරියේ සිවිල් පාලනය ප්‍රශ්නයට බඳුන් කලේය. '' මා හිතන්නේ අනෙකුත් රටවලදී වගේම මෙහිදීත් ආන්ඩු වෙනස් වුවත් ජාතික ආරක්ෂාව වෙනස් නොවිය යුතු බවයි. ජනාධිපති දේශප්‍රේමියෙක් විය යුතුය. බලයේ සිටින්නේ කවරෙක් වුවත් අපි අභිමානයෙන් හා ගෞරවයෙන් යුතු ජීවිතයක් ගතකල යුතු බව (ඔහු හෝ ඇය) පිලිගත යුතුය. ජනාධිපතිවරු හා දේශපාලඥයෝ පැමින ඉවත්ව යති. එහෙත් පුරවැසියෝ එසේම සිටිති. ඔවුන්ට ආරක්ෂාව අවශ්‍යය.'' ඔහු පැවසීය.

යුද්ධය ජයගැනීමත් සමඟම ආන්ඩුව එක දිගට ගෙනගිය මිලිටරි උපහාර උත්සව මාලාවක කොටසක් ලෙස ජනාධිපති රාජපක්ෂ, ත්‍රිවිධ හමුදාපතිවරු සම්පූර්න තරු හතරේ නිල තත්වයට උසස් කරන ලදී. සේවයේ නියුතු නිලධාරීන් එවන් තත්වයකට උසස් කරන ලද පලමු අවස්ථාව එයයි. ෆොන්සේකා ජෙනරාල් තත්වයට ද නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ අද්මිරාල් තත්වයට ද ගුවන් හමුදාපති රොෂාන් ගුනතිලක එයා චීෆ් මාර්ෂල් තත්වයට ද උසස් කරන ලදී.

සීඩීඑස්ගේ අත යටතේ හමුදාවල බලතල සංකේන්ද්‍රනය කර තහවුරු කිරීම වනාහි, රට මිලිටරිකරනය කිරීමේ නව අදියරක එක් කොටසකි. රටේ දෙමල සුලුතරයට එරෙහිව දශක ගනනාවක් තිස්සේ පවත්වාගෙන ගිය නිල වෙනස්කම්කිරීමේ පිලිවෙතෙන් අනතුරුව පාලක පැලැන්තිය, 1983 දී රට සිවිල් යුද්ධයකට ඇද දැමීය. වැඩකරන ජනතාව වාර්ගික රේඛාවන් ඔස්සේ බෙදා, සිංහල ප්‍රභූ පැලැන්තියේ පාලනය ස්ථාපිත කිරීම සඳහා බලයට පත් ආන්ඩු විසින් යොදාගත් ප්‍රධාන අවිය වූයේ, දෙමල විරෝධී ස්වෝත්තමවාදයයි.

යුද්ධය දිග්ගැස්සෙන තතු හමුවේ මිලිටරිය, දේශපාලන දිවියෙහි එන්ට එන්ටම ප්‍රමුඛ භූමිකාවක් ඉටු කලේය. 1982-86 අතර ත්‍රිවිධ හමුදාව 15000 සිට 36000 දක්වා ඉහල ගියේය. 2006 දී රාජපක්ෂ ආන්ඩුව යුද්ධයට යලි අවතීර්න වීමෙන් පසුව ත්‍රවිධ හමුදාවල ශක්තිය, 300000 ද ඉක්මවා වර්ධනය විය. 1978 දී ආරක්ෂක වියදම දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.5 ක් එනම් ඇමරිකානු ඩොලර් මිලියන 40 ක් පමනකි. 1985 දී එය සියයට 3.5 දක්වා ඩොලර් මිලියන 215 කින් ඉහල නැගුනි. 2008 වසරේදි එය සියයට 4.5 ක් දක්වා, බිලියන 1.7 තෙක් වැඩිවිය.

ආරක්ෂක ලේකම් රාජපක්ෂ හා හමුදා ප්‍රධානීන්, යුද්ධය අවධියේදී තමන් ඉල්ලා සිටි සියල්ල සපයා දෙමින් සිය මිලිටරි සැලසුම් ක්‍රියාවට නැගීම සඳහා පූර්න නිදහස ලබාදීම පිලිබඳව, ජනාධිපති රාජපක්ෂ වෙත ඔවුන්ගේ ප්‍රනාමය පුදකලහ. යුද්ධයේ අවසන් දින වලදී, ක්‍රියාන්විතයෙහි නිර්ධය භාවය මනාව පෙන්නුම් කෙරුනි. එක්සත් ජාතින්ගේ ගනන් බැලීම් අනුව ජනවාරි 20 දින සිට මැයි 07 දින දක්වා සිවිල් වැසියන් 7000 මියගොස් තවත් දස දහස් ගනනක් තුවාල ලැබීය. තුන් ලක්ෂයක් පමන දෙමල ජනතාවට, යුද කලාපයෙන් පලායාමට බලකෙරුනු අතර, කිසිඳු ව්‍යවස්ථාමය හෝ නීතිමය වරපත්‍රයකින් තොරව ඔවුන් මිලිටරිය විසින් ඉදිකල රැඳවුම් කඳවුරු තුලට ගාල්කර තිබේ.

කාලයක් තිස්සේ රාජපක්ෂ ආන්ඩුව මිලිටරියට සහාය දීම තුල, එහි යුද අපරාධ මෙන්ම, නීතිය හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීමේ අවස්ථා වසං කර ගැනීම ද ඇතුලත්ය. වසර ගනනාවක් තිස්සේ මිලිටරිය, දේශපාලඥයන්ට, මාධ්‍යවේදීන්ට හා, අනේඩුවට මෙන්ම මිලිටරියට විරුද්ධවූ ඕනෑම අයෙකුට එරෙහිව මුදාහරින ලද, අර්ධ සන්නද්ධ කන්ඩායම් හා මිනීමරු කල්ලි ගොඩනගා තිබුනි.

එල්ටීටීඊ පරාජයෙන් පසුව මිලිටරිය, බහුතරයක් දෙමල ජනතාව වාසය කරන දිවයිනේ උතුරේ හා නැගෙනහිර, ස්ථාවර මිලිටරි වාඩිලෑමක් සූදානම් කරමින් සිටියි. හමුදාව, කලින් එල්ටීටීඊ කඳවුරු ලෙස පැවති වන්නියේ කිලිනොච්චි හා මුලතිව්හි මූලස්ථාන දෙකක් ඉදිකිරීමට සැලසුම් කර තිබේ. කොලඹ මුල්කරගත් සතිපතා නේෂන් පුවත්පතට ෆොන්සේකා මෙසේ කියා තිබුනි: ''ඒවාට අනුයුක්ත කෙරෙන හමුදා භටයන් එදිනෙදා ආරක්ෂක කටයුතුවල නිරත වනු ඇත. ක්‍රියාන්විතයන්හි යෙදීම සඳහා තවත් එවැනි ඒකක අවශ්‍ය වනු ඇත. හමුදා ආඥාපතිගේ ඒකක, සංචිත ප්‍රහාරක ඒකක ලෙස සේවයෙහි යෙදෙනු ඇත.''

එල්ටීටීඊ පරදා ලැබූ ජයග්‍රහනය හමුවේ, මිලිටරි ක්‍රියාන්විතයන්හි ප්‍රමානය හා පරිමාව අඩුවීම කෙසේ වෙතත්, ඒවා තව තවත් උලුප්පමින් තිබේ. ෆොන්සේකා මීට පෙර මාධ්‍ය වෙත ප්‍රකාශ කොට තිබුනේ, හමුදා භටයන් සංඛ්‍යාව 200000 සිට 300000 දක්වා වැඩි කල යුතු බවත්, හමුදාව නවීකරනය කල යුතු බවත් ය. හමුදාවට හා ගුවන් හමුදාවට අලුතින් බඳවා ගැනීම් දැනටමත් සිදුවෙමින් තිබේ.

මිලිටරියේ තවදුර පුලුල් කිරීම්, හුදෙක් කොලඹ පාලනයට එල්ලවන දෙමල ප්‍රතිරෝධය මඩීම පිලිබඳ කාරනයක් නොවේ. ජාතිය ගොඩනැගීමේ නාමයෙන් ආන්ඩුව, යුද්ධයේ ආර්ථික බර හා ගැඹුරුවන ගෝලීය ආර්ථිකයේ බර, වැඩකරන ජනතාව මත පැටවීමට සූදානම් වෙමින් සිටියි. මාර්තු මාසය අවසානය දක්වා ගතවූ මාස 12 තුල ඇඟලුම් අංශයේ පමනක් කම්කරු රැකියා ලක්ෂයක් අහෝසිවී ඇති බව කම්කරු ඇමතිවරයා පිලිගෙන තිබේ. ආරක්ෂක හමුදා තරකිරීමේ අරමුන වී ඇත්තේ, ආන්ඩුවේ නව ''ආර්ථික යුද්ධයට'' එරෙහිව පැන නගින මහජන විරෝධය මැඩීමයි.

බලයට පත් ආන්ඩුවලට එරෙහි විරෝධතාවන් මැඩීමෙහිලා, මිලිටරියට ඇත්තේ රුදුරු වාර්තාවකි. 1953 වසරේ අගෝස්තු මාසයේ එවක ආන්ඩුව දනගැස්සූ හර්තාලය, නැත්නම් රටපුරා කර්මාන්තශාලා හා ව්‍යාපාර ඇන හිටවූ අවස්ථාවේදී, කම්කරුවන් ගනනාවක් මරාදමනු ලැබිනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයෙන් පැවති ආන්ඩුව 1971 දී ද, එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව 1989-90 වකවානුවේ ද, දකුනේ ගම්බද කැරලිකාරිත්වය තලාදැමීමේ දී, පිලිවෙලින් සිංහල තරුනයන් 20000 ක් හා 60000 ක් මරා දැමීය. දෙමල ජනතාවට එරෙහි 26 වසරක යුද්ධයේදී ගනන් බලා ඇති පරිදි ලක්ෂයක් දෙනා මරා දැමුනි.

දෙමල සුලුතරයේ හෝ වැඩකරන ජනතාවන්ගේ දුක්ගැනවිලි සඳහා විසඳුම් දීමට නොහැකි තතු හමුවේ ධනේශ්වර පාලක පැලැන්තිය, සිය පාලනය රැකගැනීම සඳහා වඩ වඩාත් සන්නද්ධ හමුදාවල පිහිට පතයි. අනෙක් අතට මිලිටරිය, තමන් වෙත වැඩි වැඩියෙන් බලතල පවරා ගනිමින්, පාලක සංස්ථාපිතයේ ප්‍රබල සාධකයක් බවට පත්ව තිබේ. රාජපක්ෂ ආන්ඩුව යටතේ මෙම ක්‍රියාවලිය පිම්මක් ගෙන තිබේ. මිලිටරි නායකත්වය පැලදියම් කිරීමේ තීන්දුව මෙන්ම, බඳවාගැනීම් පුලුල් කිරීම ද ඇතුලු ආන්ඩුවට හා එහි ප්‍රතිපත්තීන්ට එරෙහිව පැනැගෙන කුමන හෝ විරෝධතාවක් සමග ගනුදෙනු බේරාගැනීම පිනිස සූදානම් කෙරෙමින් ඇති වැඩ සටහන්, සියලු වැඩකරන ජනතවන්ට කෙරෙන තියුනු අනතුරු ඇඟවීමකි.

.

.

© www.wsws.org